# ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික අස්ථි මෙවලම්: අලවල ප්‍රාග් ඓතිහාසික කැණීම ඇසුරින්


## හරේන්ද්‍රලාල් නාමල්ගමුව[1], ගාමිණී අදිකාරි[1], ජීවන සුරංග ගමගේ[1]


ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ කටයුතුවලට ඉතිහාසය මේ වන විට සියවසකටත් වඩා වැඩි වේ. එම කාල පරිච්ඡේදය තුළ දේශීය හා විදේශිය පර්යේෂකයන් විවිධ ස්ථානවල හා ප්‍රදේශවල කැණීම් හා ගවේෂණ කටයුතු සිදුකර ඇත. එමගින් වැඩි අවධානය හා පර්යේෂණ කටයුතු සිදුකර ඇත්තේ තෙත් කලාපය මුල්කරගෙන ය. ප්‍රාග් ඓතිහාසික මානව අවශේෂ, ශිලා මෙවලම්, අස්ථි මෙවලම් හා සත්ත්ව අවශේෂ එම පර්යේෂණවලින් හමු වී ඇති අතර, අවම අවධානයක් යොමු ව ඇත්තේ අස්ථි මෙවලම් කෙරෙහිය. පර්යේෂණ ඉතිහාසය තුළ හමු වී ඇත් ප්‍රාග් ඓතිහාසික අස්ථි මෙවලම් වර්ගීකරණයක් පමණක් මේ වන විට ඉදිරිපත් කර ඇතත් එම අස්ථි මෙවලම් පිළිබඳ විද්‍යාත්මක ප්‍රවේශයකින් යුත් පර්යේෂණ තවමත් සිදුකර නොමැත.

වර්ෂ 2008 - 2010 කාල පරිච්ඡේදය තුළ දී පුරාවිද්‍යා පශ්චාත් උපාධි අයතනය මගින් බස්නාහිර පළාතේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලවල ග්‍රාමයේ, අලවල රජමහා විහාරයට අයත් පොත්ගුල් ලෙන නමින් ප්‍රසිද්ධ මෙම ස්ථානය කැණීම් කරනු ලැබිණ. මීටර 2x3 ප්‍රමාණයේ කැණීම් අදියර තුනක දී පවත්වාගෙන යනු ලැබූ අතර, සංසිද්ධි 42ක් හා පස් ස්තර 11ක් මේ වන විට හඳුනාගෙන ඇත. භූමිය මතුපිට සිට අඩි 5.5 (165 cm) පමණ ගැඹුරකින් යුත්ත වුවත් මව් පාෂාණය තෙක් කැණීම් සිදුකර නොමැත.

මෙහිදි හමු වූ අස්ථි මෙවලම් පිළිබඳ සිදු කළ අධ්‍යයනවලට අනුව අලවල ප්‍රාග් ඓතිහාසික ස්ථානයෙන් හඳුනානොගත් හැඩ (අස්ථි මෙවලම් කොටස්) ඇතුළුව ප්‍රාධාන වර්ග 7ක් මේ වන විට හඳුනාගෙන ඇත. සමස්ත කැණීමෙන් ලද අස්ථි මෙවලම් දෙස බැලීමේ දී අස්ථි මෙවලම් හා කොටස් 700ක් පමණ හඳුනාගෙන ඇත. ඒ අතර සත්ත්ව දත් භාවිතයෙන් කරන ලද මෙවලම්, කැපුම් සලකුණු සහිත අස්ථි මෙවලම්, විශාල අස්ථි භාවිතයෙන්

---


[1] පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

සකස්කරන හැන්දක් හෝ සීරුම් මෙවලම් මෙන්ම විදුම්, උල් ආදි වශයෙන් භාවිත කරන්නට ඇති මෙවලම් හමු වී ඇත. අලවල ප්‍රාග් ඓතිහාසික ස්ථානයෙන් හමු වන මෙම අස්ථි මෙවලම්වලට සමාන මෙවලම් කුරුවිට බටදොඹලෙන, පාහියන්ගල, කිතුල්ගල බෙලිලෙන වැනි ප්‍රාග් ඓතිහාසික සංදර්භයන් තුළ ද හමුවන බැවින් මේවා ද එම කාල වකවානුවලට සමාන විය හැකිය. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් බලාපොරොත්තු වන්නේ අලවල ප්‍රාග් ඓතිහාසික කැණීමෙන් ලද අස්ථි මෙවලම් පිළිබඳව සාකච්ඡා කිරීමටය.

ප්‍රමුඛ පදඃ අලවල ප්‍රාග් ඓතිහාසික කැණීම, අස්ථි මෙවල

**Title:** Pre Historic Bone Tools in Sri Lanka: A Study of the Findings of Excavations of Alavala Pre Historic Site

**Keywords:** Alavala Pre Historic Site, Pre Historic Bone Tools